# 15 අභිවෘද්ධි ආලේපය ලැබීමට සූදානම

කිතුනු ජීවිතය ගත කරන විට, විශ්වාසයට එරෙහි ව පැමිණෙන අභියෝග හා දුෂ්කරතාවලට සාර්ථක ව මුහුණ දී ඒවා ජය ගැනීමට අවශ්‍ය ශක්තිය අභිවෘද්ධි ආලේපය මගින් ලැබේ. එම ශක්තිය ලැබෙනුයේ යම් පුද්ගලයකු තුළ ශුද්ධාත්ම වරම් විශේෂාකාරයෙන් ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. ශුද්ධාත්ම වරම් ලබා ගැනීමට නම් අප නිසි සූදානමකින් යුතු ව අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගත යුතු ය.

## අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්

1. ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
2. වයස අවුරුදු 14 සම්පූර්ණ කර තිබීම
3. ඉෂ්ට වරප්‍රසාදය ඇති ව සිටීම (පාපයෙන් තොර වීම, ඒ සඳහා පාපෝච්චාරණය කළ යුතු ය)
4. නිසි ධර්මෝපදේශයක් ලබා සූදානම් වීම
5. මෙම ප්‍රසාද නිධානය ලබා ගැනීමට ඇති ආශාව හා උනන්දුව.

## අභිවෘද්ධි ආලේපයේ දේව ප්‍රසාද නිධානය ලබන්නන්ට ලැබෙන දීමනා

* දෙවියන් වහන්සේට "අබ්බා පියාණෙනි" යනුවෙන් ඇමතීමට හැකි වීම
* ක්‍රිස්තුන් වහන්සේට වඩාත් ගැඹුරින් සම්බන්ධ වීමට හැකි වීම
* ශුද්ධාත්ම දීමනා වර්ධනය වීම
* ශුද්ධ වූ සභාවේ පූර්ණ සහභාගිත්වය ලැබීම.
* පරිණත කිතුනුවකු හා ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ සාක්ෂිකරුවෙකු ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් විශ්වාසය ප්‍රචලිත කිරීමට හා ආරක්ෂා කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ශක්තිය ලැබීම
* ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් කිරීම.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**ශුද්ධාත්ම දීමනා 7**

- **ප්‍රඥාව** - මෙලොව වෙනුවට ස්වර්ගීය වස්තුව හා සැප සම්පත්වලට ඇලුම් කිරීම
- **තේරුම් ගැනීම** - විශ්වාසයේ සත්‍යතා තේරුම් ගැනීම
- **දැනුමැතිකම** - දේව මහිමය හා තම ගැලවීම සඳහා අවශ්‍ය දේ නිවැරදි ව තේරුම් ගැනීම
- **ධෛර්යය** - තම ආගමික කටයුතු ඉටු කිරීමේ දී මුහුණ දෙන බාධක හා ගැටලු හමුවේ නොසැලෙන අධිෂ්ඨානයකින් සිටීම
- **දැනගැන්ම** - ස්වර්ග රාජ්‍යය කරා ගමන් කිරීමේ දී මුහුණ දෙන අනතුරුවලින් වැළකීමට මග දැන ගැනීම
- **දේව භක්තිය** - දෙවියන් වහන්සේට හිමි වන්දනාව හා සේවය දීම
- **දේව භය** - දෙවියන් වහන්සේට උතුම් ම ගෞරවය දීම හා උන්වහන්සේ අකැමැති දේ නොකිරීම

**ශුද්ධාත්ම ඵල 12කි.**

1. ස්නේහය
2. ප්‍රීතිය
3. සමාදානය
4. ඉවසීම
5. කරුණාව
6. යහපත්කම
7. නොබිඳෙන දිරිය
8. සාන්තදාන්තකම
9. විශ්වාසවන්තකම
10. මර්යාදාව
11. ව්‍රතභාවය
12. පිරිසිදුකම

### අභිවෘද්ධි ආලේපය ලැබූවන්ගේ යුතුකම්

1. තමාගේ විශ්වාසය ගැඹුරු කර ගැනීම සඳහා උන්වහන්සේ පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
2. ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ස්ථිර ප්‍රේමයක් ඇති කර ගෙන එලෙස ජීවත් වීම
3. අවශ්‍ය අවස්ථාවල දී ක්‍රිස්තු ප්‍රේමය සඳහා නැඟී සිට එයට සාක්ෂි දැරීම
4. ක්‍රිස්තුන් වහන්සේ හා එක් වී ලෝකය ශුද්ධවන්තභාවයට පත් කිරීම සඳහා සැම උත්සාහයක් ම දැරීම
5. පරිණත කිතුනුවන් ලෙස
   i. වචනයෙන් සාක්ෂි දැරීම
   ii. ක්‍රියාවෙන් සාක්ෂි දැරීම.

### අභිවෘද්ධි ආලේපය දානය කරන්නා

1. රාජගුරුප්‍රසාදීන් වහන්සේ - සාමාන්‍යයෙන් අභිවෘද්ධි ආලේපය දානය කරනු ලබන්නේ රදගුරුතුමන් විසිනි.
2. වැඩිහිටියන්ට ප්‍රසාද ස්නාපනය දනය කරන විට මීසම් සේවක පියතුමා විසින්
3. රාජගුරුප්‍රසාදීන් වහන්සේගේ විශේෂ අවසර ලත් පූජාප්‍රසාදිතුමෙකු විසින්
4. මරණාසන්න පුද්ගලයෙකුට - ඕනෑම පියතුමෙකු විසින්

**ක්‍රියාකාරකම**

1. අභිවෘද්ධි ආලේපය ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහ ලියන්න.
2. ශුද්ධාත්ම දීමනා හත නම් කරන්න.

**ජීවිතයට බිඳක්**

*ශුද්ධ වූ සභාවේ වැඩිහිටියෙකු ලෙස නිතර ම අන් අයට ආදර්ශවත් ව ජීවත්වීමට උත්සහ කරමු.*